සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය
Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone
ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය
Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone
ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය
Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone

**ගම්පහ අධ්‍යාපන කලාපය**
Gampaha Education Zone

**දෙවන වාර ඇගයීම - 2025**
Second Term Evaluation - 2025

| | | | | | |
|---|---|---|---|---|---|
| ශ්‍රේණිය Grade | 8 | විෂයය Subject | නාට්‍ය හා රංග කලාව | කාලය Time | පැය 1 1/2 |

## I කොටස

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **1 සිට 5 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

01. ආහාර්ය අභිනයේදී මූලික ස්ථානයක් ගන්නේ,
    1. වේෂභූෂණ  2. අංග රචනය
    3. සංගීතය  4. නර්තනය

02. මාෂා හා වලහා නාට්‍යයේ මාෂා විසින් අමතන යහළුවන් වන්නේ,
    1. ෂේන්යා, පීටර්  2. ඈන්, පීටර්
    3. පීටර්, ෂෙවෝන්  4. ඈන්, ෂේන්යා

03. කඩු, දුන්න, පළිහ, ඊතල, හෙල්ල ආදිය අයත් වන්නේ,
    1. වේදිකා පසුතලවලට  2. නාට්‍ය ගීතවලට
    3. වේෂභූෂණවලට  4. නාට්‍යෝපකරණ වලට

04. ''රූසිරෙන් අඟනක් මෙනා
    ලොව නෑ ඉතින් තව සරිලනා'' යන ගී කොටස අයත් වන්නේ,
    1. කෝළම් ගී  2. සොකරි ගී  3. නාඩගම් ගී  4. නැළවිලි ගී

05. ශරීරය සැහැල්ලු කිරීමේ රංග අභ්‍යාසය වන්නේ,
    1. ශිථිලකරණ අභ්‍යාස  2. තාපන අභ්‍යාස
    3. දර්පනතල අභ්‍යාස  4. ශ්වසන අභ්‍යාස

- **6 සිට 10 දක්වා ප්‍රශ්න සඳහා හරි නම් (✓) ලකුණද වැරදි නම් (×) ලකුණද යොදන්න.**

06. නාට්‍යයක තේමාව යනු නාට්‍ය පෙළින් මතුවන ප්‍රධාන අදහසයි. ( )

07. රංගභාණ්ඩ නිර්මාණයේදී ඉවතලන ද්‍රව්‍ය යොදා ගත නොහැකිය. ( )

08. ''බැලුනය සහ බැලුනයට හුළං ගසන අයකු'' අනුකරණය කරන අභ්‍යාසය තාපන අභ්‍යාසයට අයත් වේ. ( )

09. ශාන්ති කර්ම ගී සම්ප්‍රදායන් තුනටම ආවේණික ලෙස ගායනා කරනු ලබයි. ( )

10. ''ආලවක දමනය'' ආගමික කතා ආශ්‍රයෙන් නාට්‍යමය අවස්ථා සෙවීමට යොදා ගත නොහැකිය. ( )

- **11 සිට 15 දක්වා ප්‍රශ්න වලට (ආ) කොටසින් ගැලපෙන පිළිතුරේ ඉංග්‍රීසි අක්ෂරය වරහන තුළ ලියන්න.**

| | | | |
|---|---|---|---|
| 11. බෝංචි වැලේ කතාව | ( ) | A | හැඟීම් ප්‍රකාශ කිරීම. |
| 12. නළු නිළියන් තෝරා ගැනීම. | ( ) | B | පරිකල්පනය |
| 13. රූපණයේදී ඉතා වැදගත් | ( ) | C | නිෂ්පාදක |
| 14. නාට්‍ය පුහුණුව සංවිධානය කිරීම | ( ) | D | නළුවරණය |
| 15. පුද්ගල බද්ධ දෙයකි. | ( ) | E | සුරංගනා කතා |

- **16 සිට 20 දක්වා ප්‍රශ්න වලට වරහනින් සුදුසු වචනය තෝරා තිත් ඉරි මත ලියන්න.**

16. තොප්පි වෙළෙන්දා ................................... නාට්‍යයකි.

17. නාට්‍ය පෙළක් තුල ................................... ඇත.

18. වර්ණ, රේඛා නිවැරදිව ................................... කරන විට හැසිර වීමට දැනුම තිබිය යුතුය.

19. නාට්‍ය රසය මතු කිරීමට හා අවස්ථා අතර සම්බන්ධය රැකීමට නාට්‍ය ............................. අවශ්‍ය වෙයි.

20. නාට්‍ය නිර්මාණයක් ජනප්‍රිය වීමට ................................... වැදගත් වෙයි.

**(අංග රචනය, රංග විධාන, ළමා, සංගීතය, තේමාව)** (ල.2 x 20 = 40)

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.**

1). (i). මාෂා හා වළහා නාට්‍යයේ අධ්‍යක්ෂකවරයා නම් කරන්න. (ල.02)

(ii). මෙම නාට්‍ය තුළ අන්තර්ගත තේමාවන් 03 ක් ලියා දක්වන්න. (ල.03)

(iii). මාෂා හා වළහා නාට්‍යයේ අවස්ථා පෙළ ගැසී ඇති ආකාරය ලියා දක්වන්න. (ල.05)

2). (i). සතර අභිනය නම් කරන්න. (ල.02)

(ii). වාචික අභිනය වේදිකා නාට්‍යයක් තුළ සුවිශේෂීව යොදන අයුරු කරුණු 03 කින් ලියා දක්වන්න. (ල.03)

(iii). අංග, ප්‍රත්‍යංග, උපාංග යනු මොනවාදැයි වෙන වෙනම ලියා දක්වන්න. (ල.05)

3). (i). පරිකල්පන නිර්මාණයන් ඉදිරිපත් කළ හැකි දෙයාකාරය ලියන්න. (ල.02)

(ii). පරිකල්පනය යනු කුමක්දැයි අර්ථකථනය කරන්න. (ල.03)

(iii). පරිකල්පන ශක්තිය මෙහෙයවා නිර්මාණ ගොඩ නැගීමේදී මතුවන වාසි මොනවාද? (ල.05)

4). (i). වේෂභූෂණ යන්න කෙටියෙන් හඳුන්වන්න. (ල.02)

(ii). වේෂභූෂණ බෙදෙන ප්‍රධාන ශෛලීන් දෙක ලියන්න. (ල.03)

(iii). වේෂභූෂණයක තිබිය යුතු ගුණාංග 05 ක් ලියා දක්වන්න. (ල.05)

5). ඔබ කැමති ජන කතාවක් ඇසුරින් නාට්‍ය පිටපතක් (නාට්‍ය පෙළක්) නිර්මාණශීලීව රචනා කරන්න.

- නාට්‍ය චරිත
- රංග විධාන
- නාට්‍යෝචිත අවස්ථා අන්තර්ගත විය යුතුයි.

(ල.10)